# 7 ශ්‍රේණිය



# විද්‍යාව

Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ක්‍රියාකාරකම්

<u>ක්‍රියාකාරකම - 1- නිවසේ ඇති අම්ල, භස්ම හා උදාසීන ද්‍රව්‍ය හඳුනාගනිමු.</u>

අවශ්‍ය ද්‍රව්‍ය - දෙහි ගෙඩියක් /බිලිං ගෙඩියක් , සබන්/ ෂැම්පු , ජලය

- පිරිසිදු කරගත් දෙහි / බිලිං ගෙඩියේ රස බලන්න.
- ඔබට දැනෙන්නේ කුමන රසයක් ද? (පැණි රස / ඇඹුල් රස / තිත්ත රස)
- එවැනි රසයක් සහිත වෙනත් ආහාර ද්‍රව්‍ය මොනවා ද?

  ........................................................................................

  ➢ ඔබ දන්නවා ද, මෙම රසයට හේතුව ඒවායේ අඩංගු **<u>අම්ල</u>** නම් වන රසායන ද්‍රව්‍යයන් ය.

- සබන්/ෂැම්පු අතින් ස්පර්ශ කරන්න.
- අතට දැනෙන සංවේදනය කුමක් ද? ( රළුබව / ලිස්සන සුළු බව)

  ➢ ඔබ දන්නවා ද,එවැනි සංවේදනයක් ඇතිවීමට හේතුව ඒවායේ අඩංගු **<u>භස්ම</u>** නම් වන රසායනික ද්‍රව්‍යයන් ය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- පිරිසිදු ජලය ස්වල්පයක් පානය කරන්න.
- ඔබට යම් විශේෂ රසයක් දැනේ ද? ..................................
- ජලය මතුපිට අතින් ස්පශර් කරන්න.ලිස්සන සුළු බවක් දැනේ ද? ..............
- මේ ආකාරයටම ආම්ලික හෝ භාස්මික ගුණ නොදක්වන ඔබ දන්නා වෙනත් ද්‍රව්‍ය මොනවා ද? ............................................................ ............................................................ ............................................................

➢ මෙසේ ආම්ලික හෝ භාස්මික රසායනිකයන් අඩංගු නොවන ද්‍රව්‍ය <u>උදාසීන ද්‍රව්‍ය</u> නම් ෙව්.

**ඉතා වැදගත්!!**

වැඩිහිටි අධීක්ෂණයකින් තොරව නිවසේ ඇති වෙනත් කිසිම ද්‍රව්‍යයක ආම්ලිකතාව හෝ භාස්මිකතාව පරීක්ෂා කිරීමට නොයන්න!!

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## <u>ක්‍රියාකාරකම 2 - දෙන ලද ද්‍රව්‍ය අම්ල, හස්ම , හා උදාසීන ද්‍රව්‍ය ලෙස වෙන් කරමු.</u>

පහත දක්වා ඇත්තේ නිවසේ දී ඔබට හුරුපුරුදු ද්‍රව්‍යකීපයකි.ඒවා අදාළ තීරුවට යොදන්න

දොඩම්,ජලය,භූමිතෙල්,විනාකිරි,දෙහි,

,ආප්පසෝඩා,නාරං,සීනි ද්‍රාවණය,

ලුණු ද්‍රාවණය,සබන් ,සියඹලා,හුනු

| අම්ල | හස්ම | උදාසීන ද්‍රව්‍ය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ක්‍රියාකාරකම 3- නිවසේදීම දර්ශක සකසා අම්ල,භස්ම,උදාසීන ද්‍රව්‍ය වෙන්කර ගනිමු.

දර්ශක කියන්නේ මොනවා ද?

ඇයි දන්නේ නැද්ද ? අම්ල සමගත් භස්ම සමගත් එකිනෙකට වෙනස් වර්ණ ලබාදෙන ද්‍රව්‍ය, දර්ශක කියලා හඳුන්වනවා

**අවශ්‍ය ද්‍රව්‍ය**

- දර්ශක සෑදීමට - පොකුරු වද මල් , නිල් කටරොළු මල්, කහ කැබලි,පුවක් කැබලි, රතු ගෝවා
- පරික්ෂා කිරීම සඳහා - දෙහි යුෂ,විනාකිරි,හුනු දියර,සබන් දියර,සෝඩා,සීනි ද්‍රවණයක්, ලුණු ද්‍රාවණයක්,අවර්ණ පැණි බීමක්.......

  විනිවිද පෙනෙන භාජන කීපයක්/වීදුරු/අවර්ණ කුප්පි

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ක්‍රමය

- දශර්ක සෑදීමට යොදා ගන්නා ද්‍රව්‍යයන් අතින් පොඩි කර හෝ කුඩා කැබලි වලට කඩා ජලය යම් ප්‍රමාණයක් එක් කර හොඳින් තම්බා ගන්න.
- ඉන්පසු ද්‍රාවනය රෙදි කැබැල්ලක් ආධාරයෙන් පෙරා ගන්න.
- ලැබෙන ද්‍රාවණ◌ෙයන් ස්වල්පයක්, පරික්ෂා කරන අවස්ථාවේ දී විනිවිද පෙනෙන භාජනයකට දමා ගන්න.
- අදාළ ද්‍රාවණ වලට දශර්ක බින්දු වශයෙන් යෙදීම සඳහා නිවසේ ඇති බිංදු පිපෙට්ටුවක්(dropper එකක් ) යොදා ගන්◌ෙන් නම් වඩාත් උචිතය.
- මුලින්ම ඔබ හොඳින් දන්නා ආම්ලික ද්‍රාවණයකට, දශර්ක  එක් කොට ලැබෙන වණර්ය නිරීක්ෂණය කරන්න.පහත වගුවේ සටහන් කර ගන්න.
- එක් එක් දශර්කය අම්ලයකදී ලබා දෙන වණර්ය පිළිබඳ අදහසක් ලබා ගන්න.
- මේ ආකාරයටම හොඳින් දන්නා භස්මයක් යොදා ගෙන ක්‍රියාකාරකම සිදු කරන්න.හොඳින් දන්නා උදාසීන ද්‍රාවණයක් යොදාගෙන ක්‍රියාකාරකම සිදුකරන්න.
- දැන් ඔබ තෝරාගත් ද්‍රව/ද්‍රාවණ සියල්ල එකිනෙක වෙන වෙනම ඔබ සැකසූ දශර්ක ආධාරයෙන් පරික්ෂාවට ලක්කරන්න.
- ලැබෙන නිරීක්ෂණ(වණර්ය) අනුව ඒවා ආම්ලික ද, භාස්මික ද, උදාසීන ද යන්න තීරණය කරන්න.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## නිරීක්ෂණ

| ද්‍රව/ද්‍රාවණ | දර්ශක | | | | |
|---|---|---|---|---|---|
| | කහ තැම්බූ ජලය | පොකුරු වද තැම්බූ යුෂ | පුවක් තැම්බූ ජලය | නිල්කටරොළු මල් තැම්බූ යුෂ | රතු ගෝවා තම්බා සාදාගත් යුෂ |
| දෙහි යුෂ | | | | | |
| සබන් දියර | | | | | |
| ලුණු ද්‍රාවණය | | | | | |
| විනාකිරි | | | | | |
| හුණු දියර | | | | | |
| ෂැම්පු දියර | | | | | |
| සෝඩා වතුර | | | | | |
| සීනි ද්‍රාවණය | | | | | |
| භූමිතෙල් (අවර්ණ) | | | | | |
| ග්ලූකෝස් ද්‍රාවණය | | | | | |

❖ ලබාගත් නිරීක්ෂණ ඇසුරෙන් ඉහත ද්‍රව/ද්‍රාවණ වෙන්කරමු.

| අම්ල | භස්ම | උදාසීන ද්‍රව්‍ය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

Copyright © www.e-thaksalawa.moe.gov.lk

<u>ක්‍රියාකාරකම 4- විද්‍යාගාරයේ පවතින අම්ල,හස්ම, දර්ශක සොයා බලමු.</u>

- පෙළපොත හා ඔබ සතුව පවතින වෙනත් විද්‍යාව පොත පත හෝ අන්තර්ජාලය භාවිතයෙන් හෝ තොරතුරු සොයා පහත වගු පුරවන්න.

<u>පාසල් විද්‍යාගාරවල පවතින අම්ල,හස්ම හා දර්ශක</u>

| අම්ල | හස්ම | දර්ශක |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

<u>එක් එක් දර්ශකය අම්ලයක දී, හස්මයක දී ලබාදෙන වර්ණය</u>

| දර්ශකය | අම්ලයක දී වර්ණය | හස්මයක දී වර්ණය |
|---|---|---|
| නිල් ලිට්මස් | | |
| රතු ලිට්මස් | | |
| pH කඩදාසි | | |
| පිනොප්තලීන් | | |
| මෙතිල් ඔරේන්ජ් | | |

- (ඔබට අවශ්‍ය නම් ලිට්මස් කඩදාසි, pH කඩදාසි යනාදිය වෙළඳපොළෙන් මිල දී ගත හැක.)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# තක්සේරුව

- ඔබට සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයක් සපයා ඇත.
   i. සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් අම්ලයක් ද? භස්මයක් ද?

   ..........................................................................

   ii. නිවසේ දී ඔබට සපයාගත හැකි ඊට සමාන රසායනික ගුණ දරන ද්‍රව්‍යයක් ලියන්න.

   ..........................................................................

   iii. පහත දැක්වෙන දර්ශක සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ්වලට යෙදූවිට ලබාදුන් නිරීක්ෂණ පදනම් කරගෙන එම දර්ශක මොනවාදැයි හඳුනාගන්න.

| සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් | දර්ශක | |
|---|---|---|
| | A | B |
| | නිල් පැහැයට හැරේ | රෝස පැහැ වේ |

A - ..................................................................

B – ..................................................................

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# සාරාංශය

## අම්ල හා භස්ම

- නිවසේ ඇති අම්ල (දෙහි ,ගොරකා )
- භාස්මික ද්‍රව්‍ය ලිස්සන සුළුය
- ආම්ලික ආහාර ඇඹුල් රසැතිය
- විද්‍යාගාරයේ ඇති අම්ල (නයිට්‍රික්, සල්පියුරික්, හයිඩ්‍රොක්ලෝරික්)
- විද්‍යාගාර දශර්ක (ලිට්මස් , පිනොප්තලීන්...)
- නිවසේ ඇති දශර්ක (කහ තැම්බූ ජලය , පුවක් තැම්බූ ජලය ....)
- විද්‍යාගාරයේ ඇති භස්ම(සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ,පොටැසියම් හයිඩ්‍රොක්සයිඩ් ,කැල්සියම් හයිඩ්‍රොක්සයිඩ්)
- නිවසේ ඇති භස්ම ( හුණු, සබන් )

Copyright © www.e-thaksalawa.moe.gov.lk